Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල සාර්ථක ක්‍රියාකාරීත්වය සඳහා සමස්ත තත්ත්ව කළමනාකරණ භාවිතයන්වල සක්‍රීය දායකත්වය

***ටී.එම්.එන්. තෙන්නකෝන්***[1]
***එල්. ඩබ්ලිව්. දසනායක***[2]

සංක්ෂේපය

පෞද්ගලීකරණය සහ ගෝලීයකරණය වූ යුගය තුළ නිෂ්පාදන කර්මාන්ත වර්තමාන වෙළෙඳපොළ ස්වරූපයේ පවතින අභියෝගවලට සාර්ථක ලෙස මුහුණ දීම සඳහා තත්ත්ව කළමනාකරණ මූලධර්මයන් කෙරෙහි වඩාත් අවධානය යොමු කරමින් සිටිනු හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආර්ථිකයේ වැදගත් භූමිකාවක් ඉටු කරනු ලබයි. එනම් රැකියා උත්පාදනය, නවෝත්පාදන බිහි කිරීම, ප්‍රාදේශීය සංවර්ධනය සහ දරිද්‍රතාව අවම කිරීම ආදියට මහත් වූ රුකුලක් සපයමින් ආර්ථිකයේ කශේරුකාව බවට පත් වී තිබේ. එබැවින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයද වෙළෙඳපොල අභියෝග ජය ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොලේ තරගකාරිත්වයට ශක්තිමත් ලෙස මුහුණ දීමට තම නිෂ්පාදනයන්හි තත්ත්වය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වමින් නිෂ්පාදන ක්‍රියාවලීන්හිදී තත්ත්ව කළමනාකරණ ක්‍රමවේද භාවිතා කරනු ලබයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා තත්ත්ව කළමනාකරණ භාවිතයන්වල බලපෑමක් තිබේද යන්න හඳුනා ගැනීමයි.

තත්ත්ව කළමනාකරණ භාවිතයන්වල බලපෑමක් තිබේද යන්න අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට වඩාත් සුදුසු වේ යැයි අදහස් කරන ලද තත්ත්ව කළමනාකරණ භාවිතයන් අටක් අදාළ කර ගන්නා ලදී. එමෙන්ම තරම පනහක් වන නියදියක් භාවිතයෙන් ආයතන භාවිත කරන තත්ත්ව කළමනාකරණ භාවිතයන්, එම භාවිතයන්වල ප්‍රතිලාභ, තත්ත්ව භාවිතයන් ක්‍රියාත්මක නොවීමට බලපාන සාධක, නවෝත්පාදන, ප්‍රමිති සහතික ලබා ගැනීම ආදී විචල්‍යයන් අධ්‍යයනය කර ඇත. අධ්‍යයනයේදී නිෂ්පාදන කර්මාන්ත පනහක් පමණක් භාවිත කිරීම, තත්ත්ව කළමනාකරණ භාවිතයන් අටක් පමණක් යොදා ගැනීම ආදී සීමා වලට යටත්ව විස්තරාත්මක සංඛ්‍යානය සහ කයි වර්ග පරික්ෂාව මගින් කරන දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

දත්ත විශ්ලේෂණය තුළින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා සමස්ත තත්ත්ව කළමනාකරණ භාවිතයන් වල බලපෑමක් ඇති බව සාධනය කිරිමට හැකි විය. එමෙන්ම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ක්‍රියාකාරිත්වය සඳහා අඛණ්ඩ වර්ධනය උදෙසා ක්‍රියාකිරීමේ මූලධර්මයද ඇතුළුව මෘදු සමස්ත තත්ත්ව කළමනාකරණ භාවිතයන් වල ප්‍රබල දායකත්වයක් ඇති බවත් දෘඪ සමස්ත තත්ත්ව කළමනාකරණ භාවිතයන්වල අඩු දායකත්වයක් ඇති බවද අධ්‍යයනය තුළින් තවදුරටත් සාධනය විය. තවද තත්ත්ව කළමනාකරණ භාවිතයන් නිසා කර්මාන්තවලට පිරිවැය අඩු කර ගැනීමට, නිෂ්පාදන වැඩි කර ගැනීමට සහ ලාභය හා වෙළෙඳපොළ කොටස වර්ධනය කර ගැනීමට හැකි වී ඇති බවද හෙළිදරව් විය.

ප්‍රමුඛ පද : සමස්ත තත්ත්ව කළමනාකරණ භාවිතයන්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ශ්‍රී ලංකාවේ, බලපෑම, වෙළෙඳපොළ

---

1 *ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* *nimmi.199204anu@gmail.com*

2 *කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* *lakdinie@kln.ac.lk*